1

## මනුෂ්‍යයා සහ දෙවියන් වහන්සේ

සම්බන්ධතාවය

### මාගේ අරමුණ - දෙවියන් වහන්සේ සමග සම්බන්ධතාවයක් ඇති කර ගැනීමටය

දෙවියන් වහන්සේ ඔබට ප්‍රේම කරයි (යොහන් 3:16; 1 යොහන් 4:19). උන්වහන්සේ ඔබව මැව්වේ එතුමන් දැන හඳුනා ගැනීමට, ප්‍රේම කිරීමට, සේවය කිරීමට හා කීකරු වීමටයි. වෙනත් වචන වලින් කිවහොත්, දෙවියන් වහන්සේ ඔබව මැව්වේ එතුමන් සමඟ ප්‍රේමණීය සම්බන්ධතාවයක් ඇති කර ගැනීමටයි (උත් 1:26-28; දේශ 12:13; මතෙ 22:36-40; ක්‍රියා17:26-27; 1 කොරි 8:6).

පටන්ගැන්මේ දී උන්වහන්සේ සියල්ල මැවූ විට එය ඉතා යහපත් විය (උත් 1:31). උන්වහන්සේ අපව මැව්වේ එතුමන් සමඟ සදහටම ජීවත් වීමටයි.

**උත්පත්ති 1:26-28**
ඉන්පසු දෙවියන් වහන්සේ; "අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු, ඔහු මුහුදේ මසුන් ද අහසේ පක්ෂීන් ද ගවමහිෂයන් ද මුළු පොළෝ තලයෙහි සියලු වන මෘගයන් ද උරගයන් ද පාලනය කෙරේවා!"යි අණ කළ සේක.

**ක්‍රියා 17:26-27**
උන් වහන්සේ එක් මිනිසෙකුගෙන් සකල මිනිස් සංහතිය මවා වදාළ සේක. මිහි පිට වාසය කරන පිණිස නියමිත කාලයන් ද වාසස්ථානවල සීමා ද නියම කළ සේක. මෙසේ කෙළේ දෙවියන් වහන්සේ ගැන හැඟීමකින් ද, හමුවන බලාපොරොත්තුවෙන් යුතුව ද උන් වහන්සේ සොයන පිණිස ය. උන් වහන්සේ අප එකිනෙකාට නුදුරු ව සිටින සේක.

2




### මගේ ගැටලුව - පව්කාරකම

ආදම් සහ ඒව (දෙවියන් වහන්සේ මැවූ පළමු මනුෂ්‍යයන්) ආරම්භයේදීම දෙවියන් වහන්සේට විරුද්ධව පව් කළහ. පාපය දෙවියන් වහන්සේට අකීකරු වීමකි (යාකොබ් 4:17; 1 යොහන් 3:4). ඔවුන් දෙවියන් වහන්සේට අකීකරු වීමේ ප්‍රතිඵලයක් ලෙස පාපය මුළු ලෝකයටම ඇතුළු වූ අතර දෙවියන් වහන්සේ සියලු මැවිල්ලට (මිනිසුන් ද ඇතුළුව) ශාප කළේය. දෙවියන් වහන්සේ ඉතා යහපත් ලෙස මැවූ දෙය දැන් දූෂිත හා මිය යමින් පවතී (උත් 3; රෝම 5:12; 8:18-22).

ආදම් සහ ඒව තුලින් හට ගත් සිද්ධිය නිසා මිනිසුන්ට පව්කාර ස්වභාවයක් ඇත. මේ නිසා අපි සියල්ලෝම පව්කාරන්ව සිටී (රෝම 3:23; 5:12). බොරු කීම, ලිංගික දුරාචාරය, කෑදරකම, වෛරය, මිනීමැරීම, බේබදුකම, රූප වන්දනාව යනාදිය පාපයට ඇතුළත් වේ (1 කොරි 6:9-10; ගලා 5:19-21; එළි 21:8).

දෙවියන් වහන්සේ මුළුමනින්ම පරිපූර්ණ හා ශුද්ධ බැවින්, එතුමන් පාපයට වෛර කරන අතර එයින් ඉවතට හැරේ (යෙසායා 59:1-2; 1 පේතෘස් 3:10-12). එබැවින් පාපය අප සියල්ලන් දෙවියන් වහන්සේගෙන් වෙන් කරයි; දෙවියන් වහන්සේ සමග අපගේ සම්බන්ධතාවය බිඳී ඇත - මෙය **ආත්මික මරණය** ලෙස හැඳින්වේ. මෙම ආත්මික මරණය නිසා අපට වරදකාරිත්වය, බිය සහ ජීවිතයේ සාමය හා අරමුණක් නොමැතිකම වැනි අයහපත් දේවල් අත්විඳීමට හේතු වේ (ගලාති 5:19-21; එපීස 2:11-12).

පාපය බොහෝ භයානක බලපෑම් ඇති කරයි, විශේෂයෙන් මරණය:

- **ආත්මික මරණය** (උත් 2:16-17; රෝම 3:23; එපීස 2:1-5).
- **ශාරීරික මරණය** (උත් 3:19; රෝම 5:12-14).
- **සදාකාලික මරණය** (මතෙව් 13:36-42,47-50; 25:41; යොහන් 3:16; රෝම 6:23; 2 තෙස 1:7-9; එළි 20:10).

ඔබ ශාරීරිකව මිය ගිය පසු දෙවියන් වහන්සේ ඔබව විනිශ්චය කරයි (හෙබ්‍රෙ 9:27). ඔබේ පව්වලට සමාව නොලැබුනහොත් ඔබට **සදාකාලික මරණය** අත්වනු ඇත, එය දෙවියන් වහන්සේගෙන් සදහටම වෙන්වීමකි. දෙවියන් වහන්සේගෙන් සහ උන් වහන්සේ ගේ ප්‍රේමයෙන් මෙම ස්ථිර වෙන්වීම නිරයේ සිදු වේ. නිරය හැඳින්වෙන්නේ අන්ධකාරයේ හා ගින්නෙහි භයානක ස්ථානයක් ලෙස ය. වැලපෙමින් හා වේදනාවෙන් සිටින ස්ථානයක් ය. සාතන්ට සහ ඔහුගේ යක්ෂයන්ටද දඬුවම් කරනු ලැබේ.

**රෝම 3:23**
සියල්ලෝ ම පව් කොට දෙවියන් වහන්සේගේ ගැළවීමේ මාගර්යෙන් ඉවත් වී සිටිති.

**රෝම 5:12**
එක මනුෂ්‍යයෙකු නිසා පාපයත්, පාපය නිසා මරණයත් ලෝකයට පිවිසියාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින්, මරණය මුළු මිනිස් සංහතියට ම පොදු ව පවතී.

**රෝම 6:23**
පාපයේ විපාකය මරණය යි, එහෙත් දෙවියන් වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ සදාතන ජීවනය යි.

3




### විසඳුමක් සඳහා මානව උත්සාහයන්

බොහෝ අය නොයෙකුත් ක්‍රියා මගින් දෙවියන් වහන්සේ වෙතට යාමට උත්සාහ කරති:

- යහපත් ක්‍රියා, උදා. දුප්පතුන්ට සහ වැඩිහිටියන්ට උදව් කිරීම.
- ආගම සහ ධර්මය, උදා. යාච්ඤා කිරීම, පල්ලියට යාම.
- අධ්‍යාපනය, උදා. දශර්නය.
- යහපත් සදාචාරය, උදා. හැමෝටම ප්‍රේම කිරීම, සත්‍යය ප්‍රකාශ කිරීම.

මේවායින් බොහොමයක් යහපත් වුවත්, මේ කිසිවක් ඔබගේ පාපයෙන් මිදීමට හෝ දෙවියන් වහන්සේ සමඟ ඇති ඔබේ සම්බන්ධතාවය යථා තත්වයට පත් නොකරනු ඇත (මතෙ 7:21-23; රෝම 3:20; 4; 5; ගලා 2:15-21; 3; එපීස 2:8-9; තීතස් 3:4-5).

**මතෙව් 7:21-23**
"ස්වගර්යෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට, 'ස්වාමීනි, ස්වාමීනි'යි කියන සියල්ලෝ ම ස්වගර් රාජ්‍යයට ඇතුළු නොවන්නෝ ය. ඒ දවසේ දී බොහෝ දෙනෙක්, 'ස්වාමීනි, ස්වාමීනි, අපි ඔබේ නාමයෙන් දිවැස් වැකි නොකීවෙමු ද? ඔබේ නාමයෙන් දුෂ්ටාත්මයන් දුරු නොකෙළෙමු ද? ඔබේ නාමයෙන් නොයෙක් ප්‍රබල ක්‍රියා නොකෙළෙමු දැ'යි මට කියනු ඇත. එවිට මම, 'කිසි කලක ඔබ නොහැඳින්නෙමි; දුදනෙනි, මා වෙතින් අහක් ව යන්නැ'යි ඔවුන්ට කියන්නෙමි."

**රෝම 3:20**
ව්‍යවස්ථාව පිළිපැදීමෙන් කිසි ම මනුෂ්‍යයෙක් දමිටු බවට පත් කරනු නොලබයි. ව්‍යවස්ථාවෙන් සිදුවන්නේ පාපය පිළිබඳ හැඟීම ඇති කිරීම ය.

**එපීස 2:8-9**
ඔබ ගැළවී සිටින්නේ දේව වරප්‍රසාදය මගින් වූ ඇදහීම කරණකොටගෙන ය. එය ඔබගේ ම ක්‍රියාවක් නොව, දෙවියන් වහන්සේගේ දීමනාව ය. ගැළවීම පුණ්‍ය ක්‍රියාවල ප්‍රතිඵලයක් නොවන බැවින්, කිසිවෙකුට පාරට්ටුවට ඉඩක් නැත.




## දෙවියන් වහන්සේගේ විසඳුම - ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ

දෙවියන් වහන්සේ ඔබට කොතරම් ප්‍රේම කරනවාද කියනවා නම්, තම පුත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ (**දේව මනුෂ්‍යයා**) තුළින් නැවත එම සම්බන්ධතාවය පිහිටුවීමට හැකි විය (යොහන් 3:16).

ජේසුස් ක්‍රිස්තුස් **දෙවියන් වහන්සේ** වන අතර උන් වහන්සේ පරිපූර්ණ හා කිසිදු පාපයක් රහිත අසීමිත වටිනාකමක් ඇති එකම පිළිගත හැකි පූජාවක් ඉදිරිපත් කළ හැකිය (යෙසායා 9:6; යොහන් 1:1-14; හෙබ්‍රෙ 7:26-28; 9:13-14; 1 පේතෘස් 2:21-22). **මනුෂ්‍යයෙකු** වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මනුෂ්‍යත්වයේ පාපය උදෙසා පූජාවක් බවට පත්විය (රෝම 8:3-4; හෙබ්‍රෙ 2:14-18).

කුරුසියේ ඇණ ගැසීමෙන් ජේසුස් ක්‍රිස්තුස් ඔබේ පාපය තමාටම භාරගෙන ඔබට නියමිත වූ දඬුවම ගෙව්වේ ය. එවිට ඔබේ පව්වලට සමාව ලැබෙනු ඇත. උන් වහන්සේ ඔබේ දඬුවම ලබා ඔබ වෙනුවට මිය ගියේය (මතෙ 20:28; 1 පේතෘස් 2:24; 3:18; 1 යොහන් 4:9-10).

ජේසුස් වහන්සේ ඔබගේ පව් වෙනුවෙන් වන්දි ගෙවූ බැවින්, දැන් ඔබට දෙවියන් වහන්සේ සමග සමගි විය හැකිය - ඔබේ සම්බන්ධතාවය යථා තත්වයට පත් කළ හැකිය. ඔබගේ පව්වලට සමාව ලැබී ඇති නිසා ඔබට ආත්මික මරණයේ සිට ආත්මික ජීවිතයට පිවිසිය හැකිය (යොහන් 5:24; 2 කොරි 5:18-21; 1 තිමෝති 2:5-6). එවිට ඔබගේ ජීවිතය දෙවියන් වහන්සේගේ ප්‍රේමය, සාමය සහ අරමුණෙන් පිරුනු ආත්මික ආශීර්වාදයක් වනු ඇත (ගලා 5:22-24; එපීස 1:3-14).

ජේසුස් ක්‍රිස්තුස්ගේ මරණය හා නැවත නැඟිටීම ආත්මික මරණය, ශාරීරික මරණය සහ සදාකාලික මරණය ජය ගත්තේය. සදාකාලික මරණයෙන් (නිරයෙන්) ඔබව ගලවා ගැනීමට ජේසුස්ට හැකිය. දෙවියන් වහන්සේට හා සදාකාල ජීවනයට ඇති එකම මාගර්ය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ **පමණක්** ය (යොහන් 14:6; 1 යොහන් 5:11-12).

**යොහන් 14:6**
ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මාගර්ය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි; මා මඟින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය".

**1 පේතෘස් 2:24**
පාපවලට අප නැසී, දැහැමි ජීවිතයක් ගත කරන පිණිස, උන් වහන්සේ ම තමන්ගේ ශරීරයෙන් කුරුසිය මත අපගේ පාප ඉසුලූ සේක. ඔබ සුව කරනු ලැබුවේ උන් වහන්සේගේ තුවාළ නිසා ය.

**1 පේතෘස් 3:18**
ක්‍රිස්තුන් වහන්සේ ඔබේ පව් උදෙසා වරක් දිවි පිදූ සේක. උන් වහන්සේ ධමර්ිෂ්ඨ ව සිටි නමුත් දෙවියන් වහන්සේ වෙතට ඔබ පමුණුවන පිණිස අධමර්ිෂ්ඨයන් වෙනුවෙන් දිවි පිදූ සේක. උන් වහන්සේ මනුෂ්‍ය ස්වභාවයෙන් මරණයට පත් කරනු ලැබූ සේක; ආත්මික ස්වභාවයෙන් උත්ථාන කරනු ලැබූ සේක




## මගේ ප්‍රතිචාරය

ඔබ කළ පව්වලට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සමාව ලැබීමට නම්, ඔබ **පසුතැවිලි වී** ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි **විශ්වාස** කළ යුතුය (මාකර් 1:14-15; යොහන් 3:16-18,36; 5:24; 8:24; 11:25-27; රෝම 10:9-13; 1 යොහන් 1:9).

**පසුතැවීම** යනු පාපයෙන් ඉවත් වී දෙවියන් වහන්සේ වෙත හැරී උන් වහන්සේ ට කීකරු වීමේ තීරණයයි. ඔබ දෙවියන් වහන්සේ වෙත හැරෙන විට, **ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස** කරන ලෙස උන් වහන්සේ දුන් අණට කීකරු වන්න. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම (හෝ ඇදහිල්ල) යන්නෙන් අදහස් කරන්නේ උන් වහන්සේ කවුරුන්ද යන්න සහ ඔබ වෙනුවෙන් කළ දේ විශ්වාස කිරීමයි (එනම්, කුරුසියේ මිය ගොස් ඔබගේ පව්වලට සමාව දීමට මළවුන්ගෙන් උත්ථාන වූ දෙවියන් වහන්සේය). පසුතැවීම හා ඇදහිල්ල එකට සිදු වේ.

**යොහන් 3:16**
"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය".

**යොහන් 5:24**
"ඒකාන්තයෙන් මම ඔබට කියමි: මාගේ වචනය අසා, මා එවා වදාළ තැනැන් වහන්සේ අදහාගන්නාට සදාතන ජීවනය ඇත; ඔහු විනිශ්වයට නොපැමිණෙයි; ඔහු මරණයෙන් ජීවනයට පැමිණ සිටියි".

**1 යොහන් 1:9**
එහෙත් අපි පාපෝච්චාරණය කරමු නම්, විශ්වාසවන්ත වූ ද, ධමර්ිෂ්ඨ වූ ද, දෙවියන් වහන්සේ සියලු පාපවලින් ද අදමිටුකම්වලින් ද අප පවිත්‍ර කරන සේක.

---

ඔබේ පව්වලට සමාව ලබාගැනීමට ඔබ කැමති නම්, එය දෙවියන් වහන්සේට කරන යාච්ඤාවෙන් තහවුරු කරන්න. පහත දැක්වෙන්නේ ඔබට යාච්ඤා කිරීම සඳහා යෝජිත යාච්ඤාවකි.

ආදරණීය ස්වගර්ීක දෙව්පියාණෙනි,

ඔබ මා කෙරෙහි දැක්වූ ප්‍රේමයට ස්තූතියි. මම පව්කාරයෙක් බව පිළිගනිමි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ මිය ගොස් මාගේ පාපයට සමාව දීම සඳහා මළවුන්ගෙන් නැගිට්ටවූ බවත්, මාගේ පාපයට ද වන්දිය ගෙවීම සඳහා උන් වහන්සේ මා වෙනුවට මිය ගිය බවත් මා විශ්වාස කරන්නෙමී. මම මාගේ පාපයෙන් ඉවත් වී මා කළ පාපවලට සමාව දෙන මෙන් ඉල්ලා සිටිමි. මම ජේසුස් ක්‍රිස්තුස්ව මාගේ ස්වාමීන් හා ගැළවුම්කාරයා ලෙස පිළිගන්නා අතර විශ්වාසවන්තව ජේසුස්ව අනුගමනය කරමි.

ජේසුස්ගේ නාමයෙන් ආමෙන්.

**ඔබ ජේසුස් ක්‍රිස්තුස්ව ඔබගේ ස්වාමියා හා ගැළවුම්කරුවා බවට පත් කර ඇත්නම් කරුණාකර අපව පල්ලියේදී සම්බන්ධ කර ගන්න. එවිට ඔබට කිතුනුවකු ලෙස වැඩීමට අපට උපකාර කළ හැකිය (මතෙව් 28:18-20; එපීස 4:11-16).**

# ජේසුස් ක්‍රිස්තුස්ගේ ශුභාරංචිය



## එන්න අප සමග එකතු වන්න

**Moreland Christian Church**
Sunday 2.30pm services are held at:

**10 Cumberland Road (cnr. Westgate Street)**
**Pascoe Vale South, VIC 3044**
**AUSTRALIA**
Melway map reference: 17 B11

Ph: 0432 377 232

www.morelandchristianchurch.org.au
info@morelandchristianchurch.org.au

Sinhalese